JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර ආදායම

නුවන් සමීර

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

MDH පුද්ගලික සමාගම 2007/07 දරණ සමාගම් පනත යටතේ 2010 වර්ෂයේ සංස්ථාපිත කරන ලද අතර දේශීය හා විදේශීය වෙළඳපොල වෙත විදුලි උපකරණ නිෂ්පාදනය හා බෙදාහැරීමේ කටයුතුවල නිරත වේ.

පහත තොරතුරු 2019/03/31 න් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

අමතර තොරතුරු:

| | රු. මිලියන |
|---|---|
| විකුණුම් - දේශීය | 138,150 |
| විදේශීය (Export) | 646,450 |
| | 784,600 |
| (-) විකුණුම් පිරිවැය | (630,122) |
| | |
| දල ලාභය | 154,478 |
| වෙනත් ආදායම් | 5,920 |
| (-) පරිපාලන වියදම් | (34,650) |
| විකුණුම් හා බෙදාහැරීම වියදම් | (13,423) |
| මූල්‍ය පිරිවැය (See 12/18) | (9,865) |
| ශුද්ධ ලාභය | 102,460 |

අමතර තොරතුරු:

i) වෙනත් ආදායම් උධෘත

| | රු. මිලියන |
|---|---|
| වෙනත් ආයතන වලින් ලද ලාභාංශ (ශුද්ධ) | 1,300 |
| පොලී ආදායම (ස්ථාවර තැන්පතුපත) ශුද්ධ | 570 |
| | |
| ජෙනරේටරයක් විකිණීම මත වූ ලාභය | 220 |
| ඉඩම් විකිණීම මත ලාභය | 3,830 |
| | 5,920 |

ii) පරිපාලන වියදම තුළ පහත දෑ ඇතුලත්ය.

- 2018 අප්‍රේල් මාසය තුළ වෙළඳපොල සමීක්ෂණයක් රු. 2,231,000 දරා සිදු කරන ලදී.
- වෙළඳපොල සමීක්ෂණයේ ප්‍රතිඵල මත වෙළඳපොල පර්යේෂණයක් ශ්‍රී ලංකාව තුල සිදු කරන ලද අතර ඒ සඳහා රු. 6,652,000 පිරිවැයක් දරන ලදී. ඒ තුලින් MDH හි නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ඉහළ නංවන ලදී. තවද මෙම පිරිවැය තුල වෙළඳපොල පර්යේෂණ සිදු කිරීමේ අරමුණින් මිලදී ගන්නා ලද රු. 1,400,000 වටිනා විද්‍යාගාර උපකරණයක්ද ඇතුලත් වේ. මිලදී ගන්නා ලද විද්‍යාගාර උපකරණය හැර අනෙකුත් පර්යේෂණ වියදම් නිවැරදිව පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- රු. 236,000 වටිනා දඩ මුදලක් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා ඇත.
- ගිණුම්කරණ ක්ෂය වියදම් රු. 14,435,000

iii) විකුණුම් හා බෙදාහැරීම් වියදම් තුල පහත දෑ අන්තර්ගත වේ.

- විනෝදාංශ වියදම් ප්‍රතිපූර්ණය 632,000 (See 10) not allow
- රු. 850,000 වටිනා කසල පුරවන බාල්දි 200 ක් නගර සභාව සඳහා පරිත්‍යාග කරන ලදී.
- රෝගී හා අවශ්‍යතා සහිත පුද්ගලයන් වාසය කර අනුමත පුණ්‍යායතනයක් සඳහා රු. 100,000 පරිත්‍යාග කරන ලදී.
- විකුණන ලද ඉඩමට මිලදී ගන්නෙකු සෙවීම සඳහ දරන ලද ප්‍රචාරණ ගාස්තු වියදම 63,000 (Not allow in Business should add to the cost of land when calculating capital gain)

iv) දේපළ, පිරියත හා උපකරණ

- 2018/19 තක්සේරු වර්ෂයේ මිලදී ගැනීම.

| | රු.000 |
|---|---|
| විද්‍යාගාර උපකරණ | 1,400,000 |
| නව ජෙනරේටරය | 5,400,000 |
| සේවක ප්‍රවාහනය කරන Mini bus | 6,340,000 |
| කළමනාකරුගේ කාර් එක | 4,200,000 |

- 2018 මැයි මාස තුළ, ජෙනරේටරය රු. 1,500,000 කට විකුණන ලද අතර, එය 2016/17 තක්සේරු වර්ෂයේ 4,800,000 කට මිලදී ගෙන ඇත. 2018 ජුලි මාසයේ නව ජෙනරේටරය රු. 5,400,000 කට පැරණි ජෙනරේටරය වෙනුවට මිලදී ගෙන ඇත. (පැරණි අනුපාතය $33\,^1/_3$ නව අනුපාතය 20%)

v) ඉංජිනේරු වෘත්තීය ආයතනයකට ගෙවීම් රු. 1,000,000 සහ සේවකයන් සඳහා ක්‍රීඩා සමාජ සාමාජික ගාස්තු ගෙවීම් රු. 500,000.

vi) ආයෝජන වත්කම් (investment Asset)

- 2018 අගෝස්තු 15 ව්‍යාපාරය රු. 13,500,000 ප්‍රතිෂ්ඨාවකට ඉඩමක් විකුණන ලද අතර මෙම ඉඩම 2000 වර්ෂයේ රු. 9,670,000 පිරිවැයට මිලදී ගන්නා ලද අතර 2017/09/30 දිනට වෙළඳපොල වටිනාකම රු. 12,750,000 කට තක්සේරු කර ඇත.

vii) වර්ෂය තුල බැහැර කරන ලද වත්කම් නැත. අනෙකුත් සියළුම වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනාව 01 අප්‍රේල් 2018 දින වන විට සම්පූර්ණයෙන්ම ලබා දී ඇත.

viii) අනෙකුත් සියළුම ව්‍යාපාරයේ වියදම් බදු සඳහා ඉඩදෙනු ලබන වියදම් වේ.

ix) ව්‍යාපාරය විසින් රු. 5,000,000 , 2018/19 තක්සේරු වර්ෂය සඳහා ස්වයං තක්සේරු පදනම මත ආදායම් බදු ගෙවා ඇත.

අවශ්‍ය දේ,

(a) මුළු බදු වගකීම ගණනය කරන්න. 2018/19

(b) 2018/19 වර්ෂය සඳහා ඉතිරි ගෙවිය යුතු බදු වගකීම ගණනය කරන්න.

(c) විකුණන ලද ඉඩම සඳහා ප්‍රාග්ධන ලාභ මත බදු ගෙවි යුතු අවසාන දිනය සඳහන් කරන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd